# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

## அரச கணக்குகள் திணைக்களம்

## Department of State Accounts


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SA/MAA/GRG/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022.07.08 |

මාර්ගෝපදේශ අංක . 02/2022
මු.රෙ. 170 (2) යටතේ ලැබෙන ත්‍යාග/ප්‍රදාන
උපයෝජනය හා ගිණුම්ගත කිරීම

<u>ශ්‍රී ලංකා රජය වෙත දේශීය ආයතන/පුද්ගලයින් විසින් ලබාදෙනු ලබන ත්‍යාග /ප්‍රදාන ගිණුම්ගත කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ</u>

ශ්‍රී ලංකා රජය වෙත ලැබෙන විදේශාධාර ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 30/94 හි විධිවිධාන අදාළ වන අතර දේශීය පුද්ගලික ආයතන හා පුද්ගලයින් විසින් ලබාදෙනු ලබන ප්‍රදාන නිසි ක්‍රමවේදයකට අනුව ගිණුම්ගත කරනු නොලබන බව භාණ්ඩාගාරය විසින් නිරීක්ෂණය කර ඇත. දේශීයව ලැබෙන ත්‍යාග/ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත මු.රෙ. 170 (2) යටතේ විස්තර කර ඇති අතර දේශීයව ලැබෙන ත්‍යාග/ප්‍රදාන උපයෝජනය කිරීම සහ ගිණුම්ගත කිරීම සඳහා වන මාර්ගෝපදේශ පහතින් දක්වා ඇත.

**1.** මුදලින් ලැබෙන ත්‍යාග/ප්‍රදාන

1.1. <u>නිශ්චිත කාර්යයක් සඳහා යැයි නියමයක් නැතිව අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙත මුදලින් ලැබෙන ත්‍යාග/ප්‍රදාන</u>

මේ සම්බන්ධයෙන් පහත පරිදි ක්‍රියා කළ යුතු ය.

1.1.1. රුපියල් මිලියනය දක්වා -

අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව මගින් දේශීය ත්‍යාග/ප්‍රදාන සඳහා වෙන් කරන ලද ආදායම් සංකේතය වන 3001.02.00 ට බැර කළ යුතු ය. ඉන්පසු 1.1.3 ඡේදයෙහි සඳහන් විස්තර අප්‍රමාදව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු ය.

1.1.2. රුපියල් මිලියන එකට වැඩි -

අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට බැර කිරීමට හැකි වන සේ අදාළ මුදල භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට චෙක්පත්/බැංකු අණකර මගින් ප්‍රේෂණය කළ යුතු ය.


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk

මෙහිදී අදාළ ආයතනයේ ගිණුම් සටහන් වනුයේ;

(අ) ත්‍යාග/ ප්‍රදාන මුදල් ලැබීම

හර:- මුදල් පොත XXXX

බැර:- තෙවන පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුම (6000-0-0-013-0-XXX-0) XXXX

(ආ) ලැබුණු මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම

හර:- තෙවන පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුම (6000-0-0-013-0-XXX-0) XXXX

බැර:- මුදල් පොත XXXX

මේ සඳහා අදාළ බැර නිවේදන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් පසුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ මුදල දේශීය ප්‍රදාන ආදායම් සංකේත අංකයට බැර කරනු ලැබේ.

1.1.3. ඉහත 1.1 යටතේ රජයේ ආදායමට බැර කළ/ බැර කළ යුතු වූ ත්‍යාග/ප්‍රදාන මුදල් පිළිබඳ පහත සඳහන් විස්තර ප්‍රේෂණය කරනු ලබන චෙක්පත සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු ය.

I. ත්‍යාගදායකයාගේ නම හා ලිපිනය
II. ත්‍යාග/ප්‍රදාන මුදලෙහි වටිනාකම
III. රජයේ ආදායමට බැර කරන ලද්දේ නම් එම දිනය
IV. රුපියල් මිලියනයට වැඩි භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල් පිළිබඳ විස්තර (දිනය, චෙක්පත් අංකය හා මුදල)

1.1.4. <u>යම් නිශ්චිත කාර්යයක් සඳහා යැයි නියමයක් නැතිව ව්‍යවස්ථාපිත ආයතන වෙත මුදලින් ලැබෙන ත්‍යාග/ප්‍රදාන</u>

යම් ව්‍යවස්ථාපිත ආයතනයක් (1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ නිර්වචනය කර ඇති) වෙත ලැබුණු ත්‍යාගයක්/ප්‍රදානයක් සම්බන්ධයෙන් වන විට එම ආයතනය විසින් එම මුදල් අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කළ යුතු අතර අදාළ අමාත්‍යාංශය එම මුදලේ වටිනාකම අනුව ඉහත 1.1.1 හෝ 1.1.2 ඡේදයේ පරිදි කටයුතු කළ යුතු ය.

1.2. <u>යම් නිශ්චිත කාර්යයන් සඳහා යෙදිය යුතු යැයි ඉල්ලුම් කරමින් ත්‍යාග/ප්‍රදාන වශයෙන් ලැබුණු මුදල්</u>

1.2.1. ජාතික ආරක්ෂාවට, මහජන සාමය කඩවීමට හෝ ජාතීන් අතර සංහිඳියාවට බාධා ඇති කරන හෝ ජාත්‍යන්තර සබඳතාවලට අහිතකර ලෙස බලපාන කරුණු සඳහා වන ප්‍රදාන භාර නොගත යුතු ය.

1.2.2. අපේක්ෂිත කාර්යය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් මූල්‍යයනය සංකේත අංක (11), හා අදාළ වැය විෂයය යටතේ සලසාගත යුතු ය. අවශ්‍ය අක්මුදල් අදාළ වැය ශීර්ෂය යටතේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු ය.

1.2.3. **<u>යම් නිශ්චිත කාර්යයක් සඳහා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙත ලැබෙන රුපියල් මිලියන 01 දක්වා වන මුදල් ත්‍යාග/ප්‍රදාන</u>**

(i) අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා වන 6000-0-0-019-0-XXX-0 තැන්පත් ගිණුමකට (තැන්පත් ගිණුම් අංකය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු ය) බැර කළ යුතු අතර මෙම කාර්යය සඳහා දරන වියදම මූල්‍යයනය සංකේත අංක (11) යටතේ අදාළ වැය විෂයයට හර කළ යුතු ය. (මේ සඳහා වෙනම වැය විෂය අංකයක් සහ ප්‍රතිපාදන ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට කටයුතු කළ යුතු ය.)

මෙහිදී අදාළ ආයතනයේ ගිණුම් සටහන් වනුයේ;

(අ) ත්‍යාග/ප්‍රදාන මුදල් ලැබීම

| | | |
|---|---|---|
| හර:- මුදල් පොත | xxxx | |
| බැර:- 6000-0-0-019-0-XXX-0 - දේශීය ප්‍රදාන තැන්පත් ගිණුම | | xxxx |

(ආ) වියදම් දැරීම

| | | |
|---|---|---|
| හර:- ශීර්ෂය-වැඩසටහන-ව්‍යාපෘතිය-වැය විෂයය-අයිතමය-මූල්‍යයනය සංකේත අංකය | | xxxx |
| බැර:- මුදල් පොත | | xxxx |

(ii) එසේ දරන ලද වියදමට අදාළ ප්‍රදාන ආදායම් වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී ගේ අත්සනින් පහත (අ) හා (ආ) වශයෙන් දක්වා ඇති ජර්නල සටහන් දෙක භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(අ) හර:- 6000-0-0-019-0-XXX-0 - දේශීය ප්‍රදාන තැන්පත් ගිණුම xxxx

බැර:- 9212 - දේශීය ප්‍රදාන ගිණුම xxxx

**විස්තරය:-**

**[.......................... (ව්‍යාපෘතියේ නම) සඳහා ප්‍රදානයක් වශයෙන් ............... ගෙන් (ප්‍රදානකරු) ලැබුණු මුදලින් වැය කරන ලද මුදල ගිණුම්ගත කිරීම.]**

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

(ආ) හර:- 9212 - දේශීය ප්‍රදාන ගිණුම XXXX
බැර:- 3001.02.00 - දේශීය ප්‍රදාන ආදායම් ගිණුම XXXX
විස්තරය:-
[.......................... (ව්‍යාපෘතියේ නම) සඳහා ප්‍රදානයක් වශයෙන් ............... ගෙන් (ප්‍රදානකරු) ලැබුණු මුදලින් උපයෝජනය කළ මුදල රජයේ ආදායමට බැර කිරීම.]

1.2.4. <u>යම් නිශ්චිත කාර්යයක් සඳහා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙත ලැබෙන රුපියල් මිලියන 01 ට වැඩි මුදල් ත්‍යාග/ප්‍රදාන</u>

6000-0-0-019-0-XXX-0 තැන්පත් ගිණුමකට (දේශීය ප්‍රදාන තැන්පතු ගිණුම) බැර කිරීම සඳහා චෙක්පත් හෝ බැංකු අණකර (Bank Draft) මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු ය.

මෙහි දී අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ගිණුම් සටහන් වනුයේ;

(අ) ත්‍යාග/ප්‍රදාන මුදල් ලැබීම

හර:- මුදල් පොත XXXX

බැර:- 6000-0-0-013-0-XXX-0 - තෙවන පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුම XXXX

(ආ) ලැබුණු මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම

හර:- 6000-0-0-013-0-XXX-0 - තෙවන පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුම XXXX

බැර:- මුදල් පොත XXXX

ඉහත අංක 1.2.2. පරිදි අදාළ කාර්යය ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් වාර්ෂික ප්‍රතිපාදන අදාළ වැය විෂයය අංකය යටතේ සලසා ගත යුතු අතර අක්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් ලබාගත යුතු ය.

නිශ්චිත වැය විෂයය යටතේ අදාළ වියදම හර කිරීමෙන් පසු ඉහත 1.2.3 (ii) (අ), (ආ) පරිදි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රදාන ආදායම ගිණුම්ගත කරන අතර ඒ සඳහා මෙයට අමුණා ඇති ඇමුණුම 01 ආකෘතිය මගින් ත්‍රෛමාසික වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු ය.

1.2.5. <u>යම් නිශ්චිත කාර්යයක් සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් වෙත රුපියල් මිලියන 01 දක්වා ත්‍යාග/ප්‍රදාන වශයෙන් ලැබෙන මුදල්</u>

එම අදාළ මුදල ආයතනය විසින් අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කළ යුතු අතර අදාළ අමාත්‍යාංශය විසින් ඉහත 1.2.3. (i) ඡේදය පරිදි ක්‍රියාකර 6000-0-0-019-0-XXX-0 කාණ්ඩයේ තැන්පත් ගිණුමකට බැර කළ යුතුයි. වියදම් දැරීමට අවශ්‍ය මුදල් එම තැන්පත් ගිණුම මගින් අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ව්‍යවස්ථාපිත ආයතනය වෙත නිදහස්

කිරීමෙන් පසු දරන ලද සත්‍ය වියදම් මූල්‍යයනය සංකේත අංක (11) යටතේ අදාළ වැය විෂයයට හර කර ප්‍රදාන ආදායම් වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී ගේ අත්සනින් පහත දැක්වෙන ජර්නල් සටහන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(අ) හර :- ශීර්ෂය-වැඩසටහන-ව්‍යාපෘතිය-වැය විෂයය- අයිතමය-මූල්‍යයනය සංකේත අංකය xxxx

බැර :- 9212 - දේශීය ප්‍රදාන ගිණුම xxxx

**විස්තරය:-**

**[......................... (ව්‍යාපෘතියේ නම) සඳහා ප්‍රදානයක් වශයෙන් .............. (ප්‍රදානකරුගෙන්) ලැබුණු මුදලින් වැය කරන ලද මුදල වැය විෂයයට ගිණුම්ගත කිරීම.]**

(ආ) හර :- 9212 - දේශීය ප්‍රදාන ගිණුම xxxx

බැර:- 3001.02.00 - දේශීය ප්‍රදාන ආදායම් ගිණුම xxxx

**විස්තරය:-**

**[......................... (ව්‍යාපෘතියේ නම) සඳහා ප්‍රදානයක් වශයෙන් ............... ගෙන් (ප්‍රදානකරු) ලැබුණු මුදල් රජයේ ආදායමට බැර කිරීම.]**

1.2.6. <u>ව්‍යවස්ථාපිත ආයතනයක් වෙත ලැබෙන රුපියල් මිලියන 01 ට වැඩි මුදල් ත්‍යාග/ප්‍රදාන</u>

අදාළ මුදල තැන්පත් ගිණුමකට බැර කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නමට ලියන ලද චෙක්පතක් හෝ බැංකු අණකරයක් (Bank Draft) අදාළ රේඛීය අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු ය. රේඛීය අමාත්‍යාංශය මගින් මේ සඳහා අදාළ වැය විෂයය යටතේ සලසා ගන්නා ලද ප්‍රතිපාදනයට අදාළව අවශ්‍ය අක්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ අමාත්‍යාංශය වෙත නිදහස් කරන අතර අමාත්‍යාංශය විසින් වැය විෂයය හර කර අදාළ ආයතනය වෙත අක්මුදල් නිකුත් කළ යුතුයි. ප්‍රදාන ආදායම් ගිණුම්ගත කිරීම සඳහා මෙයට අමුණා ඇති ඇමුණුම 01 ආකෘතිය මගින් ත්‍රෛමාසික වාර්තා අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී විසින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය ප්‍රදාන ආදායම ගිණුම්ගත කරනු ලැබේ.

1.2.7. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙත නිශ්චිත කාර්යයක් සඳහා ලැබෙන රුපියල් මිලියන 01 දක්වා වන ප්‍රදාන මුදල්වලින් අදාළ නිශ්චිත කාර්යය නිමවීමෙන් පසු කිසියම් මුදලක් ඉතිරි වේ නම් එම මුදල ප්‍රදානකරු වෙතින් විමසා ප්‍රදානකරු වෙත ආපසු ගෙවීම හෝ රජයේ ආදායමට බැර කිරීම කළ යුතු ය. ප්‍රදානකරුගේ එකඟතාවය මත රජයේ ආදායමට බැර කළ යුතු ඉතිරි මුදල් දේශීය ප්‍රදාන සඳහා වූ අදායම් ශීර්ෂයට බැර කිරීම සඳහා ඒ බව සඳහන් කරන ලද ආවරණ ලිපියක් සමඟ 6000-0-0-019-0-XXX-0 තැන්පත් ගිණුම හර කර චෙක්පතක්/බැංකු අණකරයක් මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ මුදල දේශීය ප්‍රදාන ආදායම් ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.

එසේම, අමාත්‍යාංශයක්/දෙපාර්තමේන්තුවක් වෙත නිශ්චිත කාර්යයක් සඳහා ලැබූ රුපියල් මිලියන 01 දක්වා ප්‍රදානවලින් යම් මුදලක් ඉතිරි වේ නම් හා ප්‍රදානකරු විසින් ඉල්ලා සිටිනු ලබන්නේ නම්, එම මුදල අදාළ තැන්පත් ගිණුම් හර කර චෙක්පත් මගින් අදාළ ප්‍රදානකරු වෙත යැවීමට කටයුතු කළ යුතු වේ.

1.2.8. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන වෙත නිශ්චිත කාර්යයක් සඳහා ලැබෙන රුපියල් මිලියන 1 ට වැඩි ප්‍රදාන මුදල්වලින් අදාළ කාර්යය නිම වීමෙන් පසු කිසියම් මුදලක් ඉතිරි වේ නම්, එම මුදල ප්‍රදානකරු වෙතින් විමසා ප්‍රදානකරු වෙත ආපසු ගෙවීම හෝ 3001.02.00 දරණ ප්‍රදාන ආදායම් ගිණුමට බැර කිරීම කළ යුතු ය.

1.2.9. ප්‍රදානය රජයට ලබාදී වසර 02 ක් යන තුරු අදාළ නිශ්චිත කාර්යය ආරම්භ කිරීමට නොහැකි වන්නේ නම් ඊට හේතු ප්‍රදානකරු වෙත ලිඛිතව දන්වා යැවිය යුතු ය. අදාළ කාර්යය ඉටු නොකරන්නේ නම් හෝ ඉටු කළ නොහැකි නම් අදාළ මුදල ප්‍රදානකරු වෙතින් විමසා නැවත ප්‍රදානකරු වෙත ආපසු ගෙවීම හෝ රජයේ ආදායමට බැර කිරීම සඳහා ප්‍රදායකයාගේ ඉල්ලීම් ලිපිය සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටිය යුතු අතර එවිට ප්‍රදායක නමින් චෙක්පතක් නිකුත් කිරීමට හෝ ආදායම් ශීර්ෂය 3001.02.00 ට බැර කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ.

## 2. මුදලින් හැර වෙනත් ආකාරයකින් කෙරෙන ප්‍රදාන

(උදා: ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ හා දේපළ වශයෙන්)

මේ සම්බන්ධයෙන් පහත ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතු ය.

### 2.1. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙත මුදලින් හැර වෙනත් ආකාරයකින් කෙරෙන ප්‍රදාන

2.1.1. කිසියම් නිශ්චිත හෝ නිශ්චිත නොවන ව්‍යාපෘතියක සෘජුවම ප්‍රයෝජනයට ගැනීම සඳහා ද්‍රව්‍ය, යන්ත්‍ර හා උපකරණ, දේපළ වශයෙන් දේශීය ආයතන හෝ මහජනයා විසින් ආධාර ලබාදුන් කල්හි එම අයිතමයන්ට අදාළ ලිපි ලේඛනවල තොරතුරු පදනම් කරගෙන හෝ තක්සේරු කරන ලද එකී ප්‍රදානයේ රුපියල් වටිනාකම හෝ අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කළ යුතු ය. එම වටිනාකමට අදාළව ඇස්තමේන්තුවල මූල්‍යායනය සංකේත අංක (11) යටතේ අයවැය ප්‍රතිපාදන සලසාගත යුතු ය. (ගිණුම්ගත කිරීමේ ක්‍රියාවලිය 2.1.4 මගින් දැක්වේ.)

2.1.2. ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ, දේපළ පිළිබඳ විස්තර, බඩු ලේඛනයෙහි හෝ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් මෙකී කාර්යය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වෙනත් ලේඛනයක වහාම සටහන් කර අදාළ ලේඛන යාවත්කාලීන කළ යුතු අතර මූල්‍ය නොවන වත්කම් ලෙස නව CIGAS වැඩසටහනට ඇතුළත් කළ යුතු ය.

2.1.3. මාසික ගිණුම් සාරාංශයේ හෝ පැවරුම් නියෝගයේ ඇතුළත් කරන ලද ප්‍රදාන වටිනාකම සහිත සියලු ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ, දේපළ බඩු ලේඛනයට, වත්කම් ලේඛනයට හෝ ආයතනය විසින් ඒ සඳහා පවත්වාගෙන යනු ලබන වෙනයම් ලේඛනයකට ඇතුළත් කර ඇති බවට වග බලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීමක් වනු ඇත. වත්කම් ඇතුළත් කර ගන්නා ලද බඩු ලේඛනයක හෝ වෙනත් ලේඛනයක පත්‍රිංරු අංකය දැක්වෙන සහතිකයක් අදාළ පැවරුම් නියෝගයට යා කළ යුතුවේ.



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

2.1.4. අදාළ ප්‍රදාන වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා පහත දක්වා ඇති විස්තර ඇමුණුම 02 ආකෘතිය සමඟ ත්‍රෛමාසිකව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය.

I. ත්‍යාගදායකයාගේ නම හා ලිපිනය
II. ත්‍යාග ලෙස ලද භාණ්ඩ/උපකරණ මූල්‍යමය වටිනාකම
III. ලද දිනය
IV. වත්කම් ඇතුළත් කර ගන්නා ලද බඩු ලේඛනයක හෝ වෙනත් ලේඛනයක පත්ඉරු අංකය දැක්වෙන සහතිකයක්
V. මූල්‍යයනය සංකේතය (11) යටතේ සලසා ගන්නා ලද අදාළ වැය විෂයේ ඉතිරිව පවතින ප්‍රතිපාදන ප්‍රමාණය සහ එම වැය විෂයයට හර කිරීම සඳහා එකඟතාවය

ඉහත විස්තර අදාළ ආයතන විසින් වාර්තා කළ පසුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පහත පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ

(අ) හර :- ශීර්ෂය-වැඩසටහන-ව්‍යාපෘතිය-වැය විෂයය-අයිතමය-මූල්‍යයනය සංකේත අංකය xxxx

බැර :- 9212 - දේශීය ප්‍රදාන ගිණුම xxxx

**විස්තරය:-**
**[.......................... (ව්‍යාපෘතියේ නම) සඳහා ප්‍රදානයක් වශයෙන් .............. ගෙන් (ප්‍රදානකරුගෙන්) ලැබුණු ද්‍රව්‍ය සහ උපකරණවල වටිනාකම.]**

(ආ) හර :- 9212 - දේශීය ප්‍රදාන ගිණුම xxxx

බැර:- 3001.02.00 - දේශීය ප්‍රදාන ආදායම් ගිණුම xxxx
**විස්තරය:-**
**[.......................... (ව්‍යාපෘතියේ නම) සඳහා ප්‍රදානයක් වශයෙන් .............. ගෙන් (ප්‍රදානකරුගෙන්) ලැබුණු ද්‍රව්‍ය සහ උපකරණවල වටිනාකම රජයේ ආදායමට බැර කිරීම.]**

**2.2 ව්‍යවස්ථාපිත ආයතනය වෙත ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ හා දේපළ වශයෙන් ලැබෙන ප්‍රදාන**

ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ, දේපළ වශයෙන් කිසියම් ව්‍යවස්ථාපිත ආයතනයක් වෙත ලැබෙන ප්‍රදාන සම්බන්ධයෙන් ඉහත 2.1.1. සිට 2.1.3. දක්වා ක්‍රියාවලිය එම ආයතනයට අදාළ වන පරිදි සිදුකළ යුතු ය. අදාළ ප්‍රදාන වටිනාකම රජයේ මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය විම අවශ්‍ය වන බැවින් ගිණුම්ගත කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන අදාළ අමාත්‍යාංශය විසින් සලසා ගත යුතු ය. අදාළ ආයතනය විසින් ප්‍රදාන වටිනාකම අමාත්‍යාංශය වෙත සනාථ කර එවීමෙන් පසු අමාත්‍යාංශය විසින් වැය විෂයයට හර කිරීම සඳහා එකඟතාවය සමඟ ඉහත 2.1.4. යටතේ සඳහන් තොරතුරු ඇමුණුම 02 ආකෘතිය සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත එවීමෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ ගිණුම් සටහන් තබනු ලැබේ.

2.2.1. යම් නිශ්චිත හෝ නිශ්චිත නොවන ව්‍යාපෘතියක සෘජුවම ප්‍රයෝජනයට ගැනීම සඳහා ව්‍යවස්ථාපිත ආයතන වෙත ප්‍රදාන වශයෙන් ලැබෙන ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ හෝ දේපළ එම ව්‍යවස්ථාපිත ආයතන විසින්ම භාවිතා කරනු ලබන අවස්ථාවක අදාළ අමාත්‍යාංශය විසින් එම ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ හෝ දේපළ ව්‍යවස්ථාපිත ආයතනය වෙත පවරා දීමට කටයුතු කළ යුතු ය.

3. මෙම මාර්ගෝපදේශයේ විධිවිධාන 2022.08.01 දින සිට වලංගු වේ.

ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:

01. විගණකාධිපති


රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

ඇමුණුම **01**

භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්

**............................. දිනෙන් අවසන් වූ කාර්තුව තුළදී දේශීය ප්‍රදානයන් පිළිබඳ මුදල් ප්‍රතිපාදනවලින් කරන ලද වැය පිළිබඳ ප්‍රකාශය**

| ඇස්තමේන්තුගත ප්‍රතිපාදන පිළිබඳ විස්තර | | | | | | අතිරේක ප්‍රතිපාදන හෝ මු.රෙ. 66 මගින් ලබාගත් ප්‍රතිපාදන මුදල රු. | භාණ්ඩාගාර යොමුව | | හර කරන ලද වැය රු. | | ප්‍රදාන ගිණුම් නාමය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැය ශීර්ෂය | වැඩසටහන | ව්‍යාපෘතිය | වැය විෂයය | මූල්‍යකරණ සංකේතය | ප්‍රතිපාදන රු. | | අංකය | දිනය | | | |
| | | | | | | | | | | | |

දිනය:

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවේ නම:

ඇමුණුම 02

භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්

**............................. දිනෙන් අවසන් වූ කාර්තුව ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ හා දේපළ වශයෙන් දේශීයව ලැබුණු ප්‍රදානයන් පිළිබඳ භාණ්ඩාගාරයේ ප්‍රදාන ගිණුමට බැර කළ යුතු වටිනාකම පිළිබඳ ප්‍රකාශය**

| ඇස්තුමේන්තුගත ප්‍රතිපාදන පිළිබඳ විස්තර | | | | | | ප්‍රතිපාදනයට හර කර ප්‍රදාන ගිණුමට බැර කළ යුතු වටිනාකම රු. | ලැබුණු අයිතමයන් පිළිබඳ විස්තර |
|---|---|---|---|---|---|---|---|
| වැය ශීර්ෂය | වැඩසටහන | ව්‍යාපෘතිය | වැය විෂයය | මූල්‍යකරණ සංකේතය | මුළු ප්‍රතිපාදනය රු. | | |
| | | | | | | | |

ඉහත කාර්තුවේදී ලැබුණු ද්‍රව්‍ය, යන්ත්‍ර, උපකරණ හා දේපළ කාර්යාලයෙහි පවත්වාගෙන යන බඩු ලේඛනයේ/ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කර තිබෙන බව මෙයින් සහතික කරමි.

දිනය:

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවේ නම: